ජාතික තරුණ සේවා සභාව

"ප්‍රාථමික ශිල්පීය නොවන" සේවා ගණයේ තනතුරු සඳහා

කාර්යක්ෂමතා කඩඉම් විෂය නිර්දේශය

1. සේවා ගණය : ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1)

2. සේවා ගණයට අයත් තනතුරු -

කාර්යාල සහායක

මුරකරු

කම්කරු

සනීපාරක්ෂක උද්‍යාන කම්කරු

3. . කාර්යක්ෂමතා කඩඉම් - පත්කිරීමේ බලධාරියා විසින් පත් කෙරෙන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකි.

4. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සඳහා විෂය නිර්දේශය :

4.1. පහත සඳහන් සංරචකයන් ආවරණය වන පරිදි ඒ ඒ තනතුරට අදාළව විෂය නිර්දේශය සකස් කර ගත යුතුය.

4.1.1. පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පත්වීමේ දින සිට වසර තුනක් (03) ඇතුලත සමත් විය යුතුය.

වගුව -1

| අනුක්‍රමික අංකය | විෂය | ලකුණු | විෂය නිර්දේශ (III වන ශ්‍රේණිය) |
|---|---|---|---|
| 01 | විෂය දැනුම | 100 | (අ) අදාළ සේවකයා ජාතික තරුණ සේවා සභාවේ කාර්යභාරය හා කටයුතු පිළිබඳව අවශ්‍යවන පරිදි දැනුම ලබා ඇද්දයි මැන බැලීම.<br>(ආ) සාමාන්‍ය කාර්යාල කාර්ය ක්‍රම සහ ආයතනික පරිපාලන ක්‍රමවේදයන් පිළිබඳව තම සේවයට අදාළ දැනුම<br>(ඇ) තනතුරට පැවරෙන විවිධ කාර්යයන් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් හා ප්‍රවීණතාවක් අත්පත් කර ගෙන ඇත් දැයි මැන බැලීම. |

- පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විම සඳහා සෑම අපේක්ෂකයෙකු ම අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

4.2. දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය II වන ශ්‍රේණියට උසස් වී වසර 03 ක් තුළ සමත් විය යුතුය.

වගුව - 2

| අනුක්‍රමික අංකය | විෂය | ලකුණු | විෂය නිර්දේශ (II වන ශ්‍රේණිය) |
|---|---|---|---|
| 01 | විෂය දැනුම | 100 | (අ) පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේදී ආවරණය වූ විෂයනට අදාළව ගත වූ සේවා කාලය තුළ අදාළ ක්ෂේත්‍රය තුළ සිදු වී ඇති පරිපාටිමය, නීතිමය සංශෝධනයන් වැනි වෙනස්වීම් පිළිබඳ සේවකයාගේ දැනුම සහ ඔහුගේ කාර්යයනට අදාළ නව්‍යකරණයන් පිළිබඳ සේවකයාගේ කුසලතා පිළිබඳ මැන බැලීම. |

- දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම සඳහා සෑම අපේක්ෂකයෙකු ම 40% ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය.

4.3 තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය I වන ශ්‍රේණියට උසස් වී වසර 05 ක් තුළ සමත් විය යුතුය.

වගුව -3

| අනුක්‍රමික අංකය | විෂය | ලකුණු | විෂය නිර්දේශ (1වන ශ්‍රේණිය) |
|---|---|---|---|
| 01 | විෂය දැනුම | 100 | අ) පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේදී ආවරණය වූ විෂයනට අදාළව ගත වූ සේවා කාලය තුළ අදාළ ක්ෂේත්‍රය තුළ සිදු වී ඇති පරිපාටිමය, නීතිමය සංශෝධනයන් වැනි වෙනස්වීම් පිළිබඳ සේවකයාගේ දැනුම සහ ඔහුගේ කාර්යයනට අදාළ නව්‍යකරණයන් පිළිබඳ සේවකයාගේ කුසලතා පිළිබඳ මැන බැලීම. . |

❖ තෙවන කාර්යක්ෂමතා කඩඉම සමත් වීම සඳහා සෑම අපේක්ෂකයෙකු ම 40% ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

ජාතික තරුණ සේවා සභාව

"ප්‍රාථමික අර්ධ ශිල්පීය" සේවා ගණයේ තනතුරු සඳහා

කාර්යක්ෂමතා කඩඉම් විෂය නිර්දේශය

1. සේවා ගණය: ප්‍රාථමික - අර්ධ ශිල්පීය (PL 2)

2. සේවා ගණයට අයත් තනතුරු

   අරක්කැමි

   සහාය කලා ශිල්පී - නැටුම්

   සහාය කලා ශිල්පී - සංගීත

   සංචාරක බංගලා භාරකරු

3. කාර්යක්ෂමතා කඩඉම් - පත්කිරීම් බලධාරියා විසින් පත් කෙරෙන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් හා නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයකි.

4. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සඳහා විෂය නිර්දේශය

4.1. පහත සඳහන් සංරචකයන් ආවරණය වන පරිදි ඒ ඒ තනතුරට අදාළව විෂය නිර්දේශය සකස් කර ගත යුතුය.

4.1.1 පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පත්වීමේ දින සිට වසර තුනක් (03) ඇතුලත සමත් විය යුතුය.

වගුව - 1

| අනුක්‍රමික අංකය | විෂය | ලකුණු | විෂය නිර්දේශ (III වන ශ්‍රේණිය) |
|---|---|---|---|
| 01 | විෂය දැනුම | 100 | (අ) අදාළ සේවකයා ජාතික තරුණ සේවා සභාවට පැවරෙන කාර්යයන් පිළිබඳව අවශ්‍ය වන පරිදි දැනුම ලබා ඇත්දැයි මැන බැලීම.<br>(ආ) සාමාන්‍ය කාර්යාල කාර්ය ක්‍රම සහ ආයතනික පරිපාලන ක්‍රමවේදයන් පිළිබඳව තම සේවයට අදාළ දැනුම මැන බැලීම.<br>(ඇ) තනතුරට පැවරෙන විවිධ කාර්යයන් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් හා ප්‍රවීණතාවක් අත්පත් කර ගෙන ඇත් දැයි මැන බැලීම. |

- පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් වීම සඳහා සෑම අපේක්ෂකයෙකු ම අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

4.2 දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය II ශ්‍රේණියට උසස් වී වසර 03 ක් තුළ සමත් විය යුතුය.

වගුව - 2

| අනුක්‍රමික අංකය | විෂය | ලකුණු | විෂය නිර්දේශ (II වන ශ්‍රේණිය) |
|---|---|---|---|
| 01 | විෂය දැනුම | 100 | (අ) පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේදී මැන බලන ලද පරාසය ඇතුළත ගත වූ සේවා කාලය තුල අදාළ ක්ෂේත්‍රයෙහි සිදු වී ඇති පරිපාටිමය, නීතිමය සංශෝධනයන් වැනි වෙනස්වීම් පිළිබඳ සේවකයාගේ දැනුම හා ඒ සඳහා වන දිශාභිමුඛ වීම පිළිබඳ මැන බැලීම.<br>(ආ) තනතුරට අදාල ශිල්පීය කාර්යයන් පිළිබඳ කුසලතාවන් සිය ජ්‍යෙෂ්ඨතාව ගැලපෙන මට්ටමින් දියුණු කර ගෙන තිබේදැ යි මැන බැලීම. |

- දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම සඳහා සෑම අපේක්ෂකයෙකු ම 40% ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය.

4.3 තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය I ශ්‍රේණියට උසස් වී වසර 05 ක් තුළ සමත් විය යුතුය.

වගුව - 3

| අනුක්‍රමික අංකය | විෂය | ලකුණු | විෂය නිර්දේශ (1වන ශ්‍රේණිය) |
|---|---|---|---|
| 01 | විෂය දැනුම | 100 | . අ) පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේදී මැන බලන ලද පරාසය ඇතුළත ගත වූ සේවා කාලය තුල අදාළ ක්ෂේත්‍රයෙහි සිදු වී ඇති පරිපාටිමය, නීතිමය සංශෝධනයන් වැනි වෙනස්වීම් පිළිබඳ සේවකයාගේ දැනුම හා ඒ සඳහා වන දිශාභිමුඛ වීම පිළිබඳ මැන බැලීම.<br>(ආ) තනතුරට අදාල ශිල්පීය කාර්යයන් පිළිබඳ කුසලතාවන් සිය ජොෂ්ඨතාව ගැලපෙන මට්ටමින් දියුණු කර ගෙන තිබේදැ යි මැන බැලීම. |

❖ තෙවන කාර්යක්ෂමතා කඩඉම සමත් වීම සඳහා සෑම අපේක්ෂකයෙකුම 40% ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

ජාතික තරුණ සේවා සභාව

“ප්‍රාථමික ශිල්පීය “ සේවා ගණයේ තනතුරු සඳහා

කාර්යක්ෂමතා කඩඉම් විෂය නිර්දේශය

1. සේවා ගණය: ප්‍රාථමික - ශිල්පීය (PL 3)

2. සේවා ගණයට අයත් තනතුරු -

රියදුරු
කාර්මික (මෝටර් රථ)
කාර්මික (නඩත්තු)
විදුලි කාර්මික
කාර්මික ශිලපී (ආලෝකකරණ)
යන්ත්‍ර ක්‍රියාකරු (විදුලි ජනන)
යන්ත්‍ර ක්‍රියාකරු (පල්දෝරු)
යන්ත්‍ර ක්‍රියාකරු (පිහිනුම් තටාක)

3. කාර්යක්ෂමතා කඩඉම්

පත්කිරීමේ බලධාරියා විසින් පත් කෙරෙන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් හා නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයකි.

4. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා විෂය නිර්දේශය:

4.1 පහත සඳහන් සංරචකයන් ආවරණය වන පරිදි ඒ ඒ තනතුරට අදාළව විෂය නිර්දේශය සකස් කර ගත යුතුය.

4.1.1 පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණය පත්වීමේ දින සිට වසර තුනක් (03) ඇතුලත සමත් විය යුතුය.

වගුව -1

| අනුක්‍රමික අංකය | විෂය | ලකුණු | විෂය නිර්දේශය (IIIවන ශ්‍රේණිය) |
|---|---|---|---|
| 01 | විෂය දැනුම | 100 | (අ). අදාළ සේවකයා ජාතික තරුණ සේවා සභාවට පැවරෙන කාර්යයන් පිළිබඳව අවශ්‍ය වන පරිදි දැනුම ලබා ඇත්දැයි මැන බැලීම.<br>(ආ). සාමාන්‍ය කාර්යාල කාර්ය ක්‍රම සහ ආයතනික පරිපාලන ක්‍රමවේදයන් පිළිබඳව තම සේවයට අදාළ දැනුම මැන බැලීම.<br>(ඇ). තනතුරට පැවරෙන විවිධ කාර්යයන් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් හා ප්‍රවීණතාවක් අත්පත් කර ගෙන ඇත් දැයි මැන බැලීම. |

- පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විම සඳහා සෑම අපේක්ෂකයෙකු ම අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

4.2 දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය II ශ්‍රේණියට උසස් වී වසර 03 ක් තුළ සමත් විය යුතුය.

වගුව - 2

| අනුක්‍රමික අංකය | විෂය | ලකුණු | විෂය නිර්දේශය (II වන ශ්‍රේණිය) |
|---|---|---|---|
| 01 | විෂය දැනුම | 100 | (අ) පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේදී මැන බලන ලද පරාසය ඇතුළත ගත වූ සේවා කාලය තුල අදාළ ක්ෂේත්‍රයෙහි සිදු වී ඇති පරිපාටිමය, නීතිමය සංශෝධනයන් වැනි වෙනස්වීම් පිළිබඳ සේවකයාගේ දැනුම හා ඒ සඳහා වන දිශාභිමුඛ වීම පිළිබඳ මැන බැලීම.<br>(ආ) තනතුරට අදාල ශිල්පීය කාර්යයන් පිළිබඳ කුසලතාවන් සිය ජොෂ්ඨතාව ගැලපෙන මට්ටමින් දියුණු කර ගෙන තිබේදැ යි මැන බැලීම. |

- ❖ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම සඳහා සෑම අපේක්ෂකයෙකු ම 40% ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය.

4.3. තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය I ශ්‍රේණියට උසස් වී වසර 05 ක් තුළ සමත් විය යුතුය.

වගුව -3

| අනුක්‍රමික අංකය | විෂය | ලකුණු | විෂය නිර්දේශය (1වන ශ්‍රේණිය) |
|---|---|---|---|
| 01 | විෂය දැනුම | 100 | (අ) පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේදී මැන බලන ලද පරාසය ඇතුළත ගත වූ සේවා කාලය තුල අදාළ ක්ෂේත්‍රයෙහි සිදු වී ඇති පරිපාටිමය, නීතිමය සංශෝධනයන් වැනි වෙනස්වීම් පිළිබඳ සේවකයාගේ දැනුම හා ඒ සඳහා වන දිශාභිමුඛ වීම පිළිබඳ මැන බැලීම.<br>(ආ) තනතුරට අදාල ශිල්පීය කාර්යයන් පිළිබඳ කුසලතාවන් සිය ජොෂ්ඨතාව ගැලපෙන මට්ටමින් දියුණු කර ගෙන තිබේදැ යි මැන බැලීම<br>. |

- ❖ තෙවන කාර්යක්ෂමතා කඩඉම සමත් වීම සඳහා සෑම අපේක්ෂකයෙකු ම 40% ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

ජාතික තරුණ සේවා සභාව

"කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා ගණය සඳහා

කාර්යක්ෂමතා කඩඉම් විෂය නිර්දේශය

1. සේවා ගණය : කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) (MA 1-1)

2. තනතුරු නාමයන්

කළමනාකරණ සහකාර
නිවාස පාලිකා
සහාය භාෂා පරිවර්තක
නිවේදක
සහකාර තරුණ සේවා නිළධාරී
තරුණ සේවා නිලධාරී - ii

3. කාර්යක්ෂමතා කඩඉම්:

කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ලිඛිත පරීක්ෂණයකි.

4. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සඳහා විෂය නිර්දේශය

පහත සඳහන් විෂය කරුණු අතුරින් ඒ ඒ තනතුරු වලට අදාළ වන කොටස් ආවරණය වන පරිදි ඒ ඒ තනතුරට අදාළව විෂය නිර්දේශය සකස් කර ගත යුතුය.

4.1. පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පත්වීම් දින සිට වසර 03 ක් ඇතුළත සමත් විය යුතුය.

වගුව - 1

| අනුක්‍රමික අංකය | විෂය | ලකුණු | කාලය | විෂය නිර්දේශය (II1වන ශ්‍රේණිය) |
|---|---|---|---|---|
| 01 | කාර්යාල ක්‍රම | 100 | පැය 01 ½ කි | පහත සඳහන් ක්ෂේත්‍ර පරීක්ෂා කෙරේ<br>(අ) ජාතික තරුණ සේවා සභාවෙහි හා අනෙකුත් රාජ්‍ය අංශයේ කාර්යාල වල භාවිතා වන කාර්යාල ක්‍රම පිළිබඳ මූලික දැනුම හා එම දැනුම භාවිතා කිරීම පිළිබඳ අපේක්ෂකයාගේ හැකියාව පරීක්ෂා කිරීම.<br>(ආ) රාජකාරී ලිපි ලේඛණ මැනවින් අවබෝධ කොට ගෙන පැහැදිලි හා සංෂිප්ත සටහන් මගින් තම අදහස් නිරීක්ෂණ නිශ්චිත අන්දමින් ඉදිරිපත් කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම.<br>(ඇ) දෙන ලද නියෝගයන් ප්‍රකාරව ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාව. |
| 02. | මූල්‍ය පරිපාලන ක්‍රමවේද පිළිබඳ මූලික දැනුම | 100 | පැය 01 ½ කි | රාජ්‍ය අංශයේ කාර්යාල වල පවත්වාගනු ලබන මූලික ගිණුම් පොත් හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ අයදුම්කරුගේ දැනුම හා අවබෝධය මැනීම අපේක්ෂා කෙරේ. |
| 03. | විෂයබද්ධ දැනුම /ප්‍රවීණතා පිළිබඳ පරීක්ෂණය | 100 | පැය 01 ½ කි | තනතුරට පැවරෙන කාර්යයන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම/ ප්‍රවීණතා මෙමගින් මැන බැලේ. |

- පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විම සඳහා සෑම අපේක්ෂකයෙකු ම අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

4.2. දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය II වන ශ්‍රේණියට උසස් වූ දින සිට වසර තුනක් (03) ඇතුලත සමත් විය යුතු ය.

වගුව - 2

| අනුක්‍රමික අංකය | විෂය | ලකුණු | කාලය | විෂය නිර්දේශය (II වන ශ්‍රේණිය) |
|---|---|---|---|---|
| 01 | කාර්යාල පරිපාටි | 100 | පැය 01 ½ කි | ආයතනික කාර්ය පරිපාටි සංග්‍රහයේ විධිවිධාන පිළිබඳ දැනුම පරීක්ෂා කෙරේ.<br>සටහන:ජාතික තරුණ සේවා සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විභාගය සඳහා යෝග්‍ය පරිච්ඡේද තීරණය කරනු ලැබේ. |
| 02. | විෂය දැනුම | 100 | පැය 01 ½ කි | පහත සඳහන් ක්ෂේත්‍ර පරීක්ෂා කෙරේ<br>(අ) අයදුම්කරුගේ ධුර කාලය තුළ ,ප්‍රථම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් ආවරණය වූ විෂයට අදාළව සිදුකළ කාර්ය පරිපාටිමය සහ නීතිමය නව්‍යකරණය පිළිබඳ දැනුම<br>(ආ) සිය අත්දැකීම් හරහා අයදුම්කරු කාර්යාල ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ලඟාකර ගෙන ඇති ප්‍රවීණතාවය ඇගයීම. |
| 03. | පොදු ප්‍රශ්න පත්‍රය | 100 | පැය 01 ½ කි | මෙම ප්‍රශ්ණ පත්‍රය පහත දක්වා ඇති පරිදි කොටස් දෙකකින් සමන්විත වේ.<br>I වන කොටස:සාකච්ඡාවක වාර්තාවක් හෝ ප්‍රකාශයක් හෝ කියවා අවබෝධ කොට ගෙන ලිපියක් හෝ වාර්තාවක් හෝ සකස් කිරීම.<br>II වන කොටස:නුතන සමාජයේ සිද්ධීන් අවබෝධ කර ගෙන විශ්ලේෂණය කිරීමේ අයදුම්කරුගේ හැකියාව තක්සේරු කිරීම |

- දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම සඳහා සෑම අපේක්ෂකයෙකු ම 40% ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය.

4.3. තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (I වන ශ්‍රේණියට උසස් වූ දින සිට වසර පහක් (05) ඇතුලත සමත් විය යුතු ය.)

වගුව - 3

| අනුක්‍රමික අංකය | විෂය | ලකුණු | කාලය | විෂය නිර්දේශ (1වන ශ්‍රේණිය) |
|---|---|---|---|---|
| 01 | විෂයානු බද්ධ දැනුම | 100 | පැය 01 කි | (අ) පළමුවන හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය මගින් ආවරණය වූ විෂය නිර්දේශයට අයත් කරුණු පිළිබඳව අදාළ නිළධාරියාගේ දැනුම හා කුසලතාවයන් ඔහුගේ ජොෂ්ඨතාවයට සරිලන පරිදි වැඩි දියුණු කරගෙන තිබේද යන්න පරීක්ෂා කර බැලීම.<br><br>(ආ) එකී ගත වූ කාලය තුල පත්වීම ලැබී ඇති ක්ෂේත්‍රයට අදාළ නව්‍යකරණයන් පිළිබඳව අයදුම්කරුගේ කුසලතාවය පරීක්ෂා කිරීම |
| 02 | කාර්යාල පරිපාටින්ට අදාළ ගැටළු (MCQ) | 100 | පැය 01 කි | කාර්යාල පරිපාලනයට අදාළව ඇති වන ගැටළුවලට ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුම මැන බැලීම. |

- තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම සඳහා සෑම අපේක්ෂකයෙකු ම 40% ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය.

ජාතික තරුණ සේවා සභාව

“කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණයේ තනතුරු සඳහා

කාර්යක්ෂමතා කඩඉම් විෂය නිර්දේශය

1. සේවා ගණය: කළමනාකරණ සහකාර ( තාක්ෂණික) (MA 2.1)

2. සේවා ගණයට අයත් තනතුරු -

කලා ශිල්පී - සංගීත / නැටුම්
සහකාර පුස්තකාලයාධිපති
පොත් තබන්නා
නිශ්චල ඡායාරූප ශිල්පී
වීඩියෝ කැමරා ශිල්පී
වීඩියෝ සංස්කාරක
පරිගණක චිත්‍ර නිර්මාණ ශිල්පී
ජාල / දෘඩාංග කාර්මික ශිල්පී
කාර්මික සහකාර (විද්‍යුත් / විදුලි / සිවිල්)
සහකාර නිෂ්පාදක
ගොවිපොල සහකාර
වෘත්තීය පුහුණු උපදේශක (ස්ථිර)

3. කාර්යක්ෂමතා කඩඉම් : සියලුම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ ලිඛිත විභාග මගින් පවත්වනු ලැබේ.

4. පහත සඳහන් විෂය කරුණු අතුරින් ඒ ඒ තනතුරු වලට අදාළ වන කොටස් ආවරණය වන පරිදි ඒ ඒ තනතුරට අදාළව විෂය නිර්දේශය සකස් කර ගත යුතුය.

4.1. පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පත්වීම් දින සිට වසර 03 ක් ඇතුළත සමත් විය යුතුය. (III ශ්‍රේණිය)

වගුව - 1

| අනුක්‍රමික අංකය | විෂය | ලකුණු | කාලය | විෂය නිර්දේශය (II1වන ශ්‍රේණිය) |
|---|---|---|---|---|
| 01 | කාර්යාල පරිපාලනය සහ පිරිස් පාලන පරිපාටි | 100 | පැය 01 ½ කි | පහත සඳහන් ක්ෂේත්‍ර පරීක්ෂා කෙරේ.<br>(අ) අයදුම්කරුගේ සේවයට අදාළ කාර්යාල පරිපාලනය පිළිබඳ (සාමාන්‍ය) දැනුම හා එම දැනුම භාවිතා කිරීම පිළිබඳ හැකියාව පරීක්ෂා කිරීම.<br>(ආ)රාජකාරි ලිපි ලේඛන මැනවින් අවබෝධ කොට ගෙන පැහැදිලි හා සංක්ෂිප්ත සටහන් මගින් තම අදහස් / නිරීක්ෂණ නිශ්චිත අන්දමින් ඉදිරිපත් කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම.<br>(ඇ) දෙන ලද නියෝගයක් ප්‍රකාරව ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාව. |
| 02 | මූල්‍ය පරිපාලන පරිපාටි | 100 | පැය 01 ½ කි | අයදුම්කරුගේ සේවයට අදාළ මූල්‍ය රෙගුලාසි පිළිබඳ දැනුම හා අවබෝධය මැනීම අපේක්ෂා කෙරේ. |

- පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විම සඳහා සෑම අපේක්ෂකයෙකු ම අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

4.2. දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය II වන ශ්‍රේණියට උසස් වූ දින සිට වසර තුනක් (03) ඇතුලත සමත් විය යුතු ය.

වගුව - 2

| අනුක්‍රමික අංකය | විෂය | ලකුණු | කාලය | විෂය නිර්දේශය (II වන ශ්‍රේණිය) |
|---|---|---|---|---|
| ➢ ➢ ➢ ➢ ➢ ➢ ➢ ➢ ➢ ➢ ➢ 01 | කාර්යාල පරිපාලනය සහ පිරිස් පාලන පරිපාටි | 100 | පැය 01 ½ | පහත සඳහන් ක්ෂේත්‍ර පරීක්ෂා කෙරේ.<br>(අ) අයදුම්කරුගේ ධූර කාලය තුළ, ප්‍රථම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් ආවරණය වූ විෂයට අදාළව සිදු කළ කාර්ය පරිපාටිමය සහ නීතිමය නව්‍යකරණ පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම.<br>(ආ) අයදුම්කරුගේ සිය අත්දැකීම් හරහා කාර්යාල පරිපාලනය සහ ආයතනික කාර්ය පරිපාටි සම්බන්ධයෙන් ළඟා කරගෙන ඇති ප්‍රවීණතාව ඇගයීම. |
| 02 | මූල්‍ය පරිපාලන පරිපාටි | 100 | පැය 01 ½ | පහත සඳහන් ක්ෂේත්‍ර පරීක්ෂා කෙරේ.<br>(අ) අයදුම්කරුගේ ධූර කාලය තුළ, ප්‍රථම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් ආවරණය වූ විෂයට අදාළව සිදු කළ කාර්යය පරිපාටිමය සහ නීතිමය නව්‍යකරණ පිළිබඳ දැනුම,<br>(ආ) සිය අත්දැකීම් හරහා අයදුම්කරු කාර්යාල ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ළඟාකරගෙන ඇති ප්‍රවීණතාව ඇගයීම. |
| 03 | තාක්ෂණික විෂයය | 100 | පැය 01 ½ කි | අයදුම්කරු සිය තනතුරට සහ ජොෂ්ඨත්වයට අදාළව තාක්ෂණික ක්ෂේත්‍රයෙන් ලබා ගත යුතු නියමිත මට්ටමේ දක්ෂතා ලබා ගෙන ඇති දැයි ඇගයීම. |

➢ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම සඳහා සෑම අපේක්ෂකයෙකු ම 40% ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය.

4.3. තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය I වන ශ්‍රේණියට උසස් වූ දින සිට වසර පහක් (05) ඇතුලත සමත් විය යුතු ය.

වගුව - 3

| අනුක්‍රමික අංකය | විෂය | ලකුණු | කාලය | විෂය නිර්දේශය (I වන ශ්‍රේණිය) |
|---|---|---|---|---|
| 01 | කාර්යාල පරිපාලනය සහ පිරිස් පාලන පරිපාටි | 100 | පැය 01 ½ | පහත සඳහන් ක්ෂේත්‍ර පරීක්ෂා කෙරේ.<br>(අ) අයදුම්කරුගේ ධූර කාලය තුළ, ප්‍රථම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් ආවරණය වූ විෂයට අදාළව සිදු කළ කාර්ය පරිපාටිමය සහ නීතිමය නව්‍යකරණ පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම.<br>(ආ) අයදුම්කරුගේ සිය අත්දැකීම් හරහා කාර්යාල පරිපාලනය සහ ආයතනික කාර්ය පරිපාටි සම්බන්ධයෙන් ළඟා කරගෙන ඇති ප්‍රවීණතාව ඇගයීම. |
| 02 | මූල්‍ය පරිපාලන පරිපාටි | 100 | පැය 01 ½ | පහත සඳහන් ක්ෂේත්‍ර පරීක්ෂා කෙරේ.<br>(අ) අයදුම්කරුගේ ධූර කාලය තුළ, ප්‍රථම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් ආවරණය වූ විෂයට අදාළව සිදු කළ කාර්යය පරිපාටිමය සහ නීතිමය නව්‍යකරණ පිළිබඳ දැනුම,<br>(ආ) සිය අත්දැකීම් හරහා අයදුම්කරු කාර්යාල ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ළඟාකරගෙන ඇති ප්‍රවීණතාව ඇගයීම. |
| 03 | තාක්ෂණික විෂයය | 100 | පැය 01 ½ කි | අයදුම්කරු සිය තනතුරට සහ ජ්‍යෙෂ්ඨත්වයට අදාළව තාක්ෂණික ක්ෂේත්‍රයෙන් ලබා ගත යුතු නියමිත මට්ටමේ දක්ෂතා ලබා ගෙන ඇති දැයි ඇගයීම. |

➢ තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම සඳහා සෑම අපේක්ෂකයෙකු ම 40% ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය.

ජාතික තරුණ සේවා සභාව

"ආශ්‍රිත ත නිලධාරි" සේවා ගණයේ තනතුරු සඳහා

කාර්යක්ෂමතා කඩඉම් විෂය නිර්දේශය

1. සේවා ගණය : ආශ්‍රිත නිලධාරි (MA 3)

2. සේවා ගණයට අයත් තනතුරු -

තරුණ සේවා නිලධාරි
සහය නිෂ්පාදක
උපදේශක 1 ශ්‍රේණිය

3. කාර්යක්ෂමතා කඩඉම් - සියලුම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ ලිඛිත විභාග මගින් පවත්වනු ලැබේ .

4. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සඳහා විෂය නිර්දේශය

4.1. පහත සඳහන් විෂය කරුණු අතුරින් ඒ ඒ තනතුරු වලට අදාළ වන කොටස් ආවරණය වන පරිදි ඒ ඒ තනතුරට අදාළව විෂය නිර්දේශය සකස් කර ගත යුතුය.

4.2. පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (පත්වීම් දින සිට වසර 03 ක් ඇතුළත සමත් විය යුතුය.)

වගුව - 1

| අනුක්‍රමික අංකය | විෂය | ලකුණු | කාලය | විෂය නිර්දේශ (II1වන ශ්‍රේණිය) |
|---|---|---|---|---|
| 01 | කාර්යාල ක්‍රම | 100 | පැය 01 ½ | පහත සඳහන් ක්ෂේත්‍ර පරීක්ෂා කෙරේ . (අ) ආයතනයෙහි කාර්යාල වල භාවිතා වන කාර්යාල ක්‍රම පිළිබඳ මූලික දැනුම හා එම දැනුම භාවිත කිරීම පිළිබඳ හැකියාව පරීක්ෂා කිරීම. (ආ) රාජකාරි ලිපි ලේඛන මැනවින් අවබෝධ කොට ගෙන පැහැදිලි හා සංක්ෂිප්ත සටහන් මගින් තම අදහස් / නිරීක්ෂණ නිශ්චිත අන්දමින් ඉදිරිපත් කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම . (ඇ) දෙන ලද නියෝගයක් ප්‍රකාරව ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාව. |
| 02 | ගිණුම් ක්‍රම | 100 | පැය 01 ½ | ආයතනයේ භාවිතා වන මූලික ගිණුම් පොත් හා මුදල් පාලන කාර්යයන් පිළිබඳ අවබෝධය හා දැනුම මැනීම අපේක්ෂා කෙරේ. |
| 03 | විෂයබද්ධ කරුණු | 100 | පැය 01 ½ | සමීක්ෂණ සංවිධානය,තොරතුරු රැස්කිරීම සඳහා වන ආකෘතිය නිර්මාණය කිරීම,එක්රැස් කල තොරතුරු විශ්ලේෂණය,සකස් කොට බෙදා හැරීම,වාර්තා /ප්‍රගති වාර්තා සකස් කිරීම ඇතුළු තනතුරට අදාළ කාර්යභාරය පිළිබඳ දැනුම හා කුසලතා මැන බැලීම. |

- පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් වීම සඳහා සෑම අපේක්ෂකයෙකු ම අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

42. දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (II වන ශ්‍රේණියට උසස් වූ දින සිට වසර තුනක් (03) ඇතුලත සමත් විය යුතු ය.)

වගුව - 2

| අනුක්‍රමික අංකය | විෂය | ලකුණු | කාලය | විෂය නිර්දේශ (II වන ශ්‍රේණිය) |
|---|---|---|---|---|
| 01 | විෂයානු බද්ධ දැනුම | 100 | පැය 01 ½ | පහත සඳහන් ක්ෂේත්‍ර පරීක්ෂා කෙරේ .<br>(අ) අයදුම්කරුගේ ධුර කාලය තුළ, ප්‍රථම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් ආවරණය වූ විෂයට අදාළව සිදු කළ කාර්ය පරිපාටිමය සහ නීතිමය නවාකරණ පිළිබඳ දැනුම ,<br>(ආ) සිය අත්දැකීම් හරහා අයදුම්කරු කාර්යාල ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ලබා කර ගෙන ඇති ප්‍රවීණතාව ඇගයීම . |
| 02 | පොදු ප්‍රශ්ණ පත්‍රය | 100 | පැය 01 ½ | මෙම ප්‍රශ්ණ පත්‍රය පහත දක්වා ඇති පරිදි කොටස් දෙකකින් සමන්විත වේ .<br>I වන කොටස : සාකච්ඡාවක වාර්තාවක් හෝ ප්‍රකාශයක් හෝ කියවා අවබෝධ කොට ගෙන ලිපියක් හෝ වාර්තාවක් හෝ සකස් කිරීම .<br>II වන කොටස : නූතන සමාජයේ ප්‍රවණතා අවබෝධ කර ගෙන විශ්ලේෂණය කිරීමේ අයදුම්කරුගේ හැකියාව තක්සේරු කිරීම. |

- දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම සඳහා සෑම අපේක්ෂකයෙකු ම 40% ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය.

4.3. තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (I වන ශ්‍රේණියට උසස් වූ දින සිට වසර පහක් (05) ඇතුලත සමත් විය යුතු ය.)

| අනුක්‍රමික අංකය | විෂය | ලකුණු | කාලය | විෂය නිර්දේශ (1වන ශ්‍රේණිය) |
|---|---|---|---|---|
| 01 | පොදු ප්‍රශ්ණ පත්‍රය | 100 | පැය 01 1/2 | මෙම ප්‍රශ්ණ පත්‍රය පහත දක්වා ඇති පරිදි කොටස් දෙකකින් සමන්විත වේ .<br>1 වන කොටස : සාකච්ඡාවක වාර්තාවක් හෝ ප්‍රකාශයක් හෝ කියවා අවබෝධ කොට ගෙන ලිපියක් හෝ වාර්තාවක් හෝ සකස් කිරීම .<br>II වන කොටස: කාලීන සමාජයේ සිද්ධීන් අවබෝධ කර ගෙන විග්‍රහ කිරීමේ අයදුම්කරුගේ හැකියාව තක්සේරු කිරීම. |

- තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම සඳහා සෑම අපේක්ෂකයෙකු ම 40% ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය.

ජාතික තරුණ සේවා සභාව

"ක්‍රියාත්මක කිරීමේ / උපදේශන සේවා'' සේවා ගණයේ තනතුරු සඳහා

කාර්යක්ෂමතා කඩඉම් විෂය නිර්දේශය

1. සේවා ගණය : ක්‍රියාත්මක කිරීමේ / උපදේශන සේවා (MA 4)

2. සේවා ගණයට අයත් තනතුරු-

ප්‍රචාරක නිලධාරී
උපදේශන සේවා නිලධාරී
භාෂා පරිවර්තක
විගණන නිලධාරී
දිස්ත්‍රික් තරුණ සේවා නිලධාරී
සහකාර ගණකාධිකාරී

3. කාර්යක්ෂමතා කඩඉම් - සියලුම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ ලිඛිත විභාග මගින් පවත්වනු ලැබේ.

4. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සඳහා විෂය නිර්දේශය

4.1. පහත සඳහන් විෂය කරුණු අතුරින් ඒ ඒ තනතුරු වලට අදාළ වන කොටස් ආවරණය වන පරිදි ඒ ඒ තනතුරට අදාළව විෂය නිර්දේශය සකස් කර ගත යුතුය.

4.2. පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (පත්වීම් දින සිට වසර 03 ක් ඇතුළත සමත් විය යුතුය.)

වගුව - 1

| අනුක්‍රමික අංකය | විෂය | ලකුණු | කාලය | විෂය නිර්දේශය (III වන ශ්‍රේණිය) |
|---|---|---|---|---|
| 01 | කාර්යාල ක්‍රම | 100 | පැය 01 ½ කි | පහත සඳහන් ක්ෂේත්‍ර පරීක්ෂා කෙරේ.<br>(අ) ආයතනයෙහි කාර්යාල වල භාවිතා වන කාර්යාල ක්‍රම පිළිබඳ මූලික දැනුම හා එම දැනුම භාවිතා කිරීම පිළිබඳව හැකියාව පරීක්ෂා කිරීම.<br>(ආ) රාජකාරි ලිපි ලේඛන මැනවින් අවබෝධ කොට ගෙන පැහැදිලි හා සංක්ෂිප්ත සටහන් මගින් තම අදහස් / නිරීක්ෂණ නිශ්චිත අන්දමින් ඉදිරිපත් කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම.<br>(ඇ) දෙන ලද නියෝගයක් ප්‍රකාරව ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාව. |
| 02 | ගිණුම් ක්‍රම | 100 | පැය 01 ½ කි | තනතුරට අදාළ වන පරිදි රාජ්‍ය අංශයේ කාර්යාලවල භාවිත වන මූලික ගිණුම් පොත් හා මූල්‍ය පාලන කාර්යයන් පිළිබඳ අවබෝධය හා දැනුම මැනීම. |

➢ කාර්යක්ෂමතා කඩඉම සමත් වීම සඳහා සෑම අපේක්ෂකයෙකු ම අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

4.3 දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (II වන ශ්‍රේණියට උසස් වූ දින සිට වසර තුනක් (03) ඇතුලත සමත් විය යුතු ය.)

වගුව - 2

| අනුක්‍රමික අංකය | විෂය | ලකුණු | කාලය | විෂය නිර්දේශය (II වන ශ්‍රේණිය) |
|---|---|---|---|---|
| 01 | ආයතනික කාර්ය පරිපාටි | 100 | පැය 01 ½ කි | ජාතික තරුණ සේවා සභාවේ කාර්ය පටිපාටි සංග්‍රහයේ විධිවිධාන පිළිබඳ අයදුම්කරුගේ දැනුම පරීක්ෂා කෙරේ. |
| 02 | විෂය දැනුම | 100 | පැය 01 ½ කි | පහත සඳහන් ක්ෂේත්‍ර පරීක්ෂා කෙරේ.<br>(අ)අයදුම්කරුගේ ධූර කාලය තුළ , ප්‍රථම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් ආවරණය වූ විෂයට අදාළව සිදු කළ කාර්ය පරිපාටිමය සහ නීතිමය නව්‍යකරණ පිළිබඳ දැනුම,<br>සහ<br>(ආ)සිය අත්දැකීම් හරහා අයදුම්කරු කාර්යාල ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ළඟා කර ගෙන ඇති ප්‍රවීණතා ඇගයීම. |
| 03 | පොදු ප්‍රශ්ණ පත්‍රය | 100 | පැය 01 ½ කි | මෙම ප්‍රශ්ණ පත්‍රය පහත දක්වා ඇති පරිදි කොටස් දෙකකින් සමන්විත වේ.<br>I වන කොටස: සාකච්ඡාවක වාර්තාවක් හෝ ප්‍රකාශයක් හෝ කියවා අවබෝධ කොට ගෙන ලිපියක් හෝ වාර්තාවක් හෝ සකස් කිරීම.<br>II වන කොටස: නූතන සමාජයේ සිද්ධීන් අවබෝධ කර ගෙන විශ්ලේෂණය කිරීමේ අයදුම්කරුගේ හැකියාව තක්සේරු කිරීම. |

- දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම සඳහා සෑම අපේක්ෂකයෙකු ම 40% ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය.

4.4. තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (I වන ශ්‍රේණියට උසස් වූ දින සිට වසර පහක් (05) ඇතුලත සමත් විය යුතු ය.)

වගුව - 3

| අනුක්‍රමික අංකය | විෂය | ලකුණු | කාලය | විෂය නිර්දේශ (1වන ශ්‍රේණිය) |
|---|---|---|---|---|
| 01 | විෂය දැනුම | 100 | පැය 01 ½ කි | (අ)පළමු වන හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය මඟින් ආවරණය වූ විෂය සම්බන්ධව අයදුම්කරුගේ ධූර කාලය තුළ අදාළ ක්ෂේත්‍රය සම්බන්ධව සිදු කළ කාර්ය පරිපාටික හා නීතිමය සංශෝධන පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම.<br>(ආ)පත්වීම ලැබී ඇති ක්ෂේත්‍රයට අදාළ නව්‍යකරණ පිළිබඳ අයදුම්කරුගේ කුසලතාව පරීක්ෂා කිරීම. |
| 02 | කාර්යාල පරිපාටි (MCQ) | 100 | පැය 01 ½ කි | කාර්යාල පරිපාටි වලට අදාළ ප්‍රශ්න සහ ගැටළු |

- තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම සඳහා සෑම අපේක්ෂකයෙකු ම 40% ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය.

ජාතික තරුණ සේවා සභාව

"කණිෂ්ඨ කළමනාකාර" සේවා ගණයේ තනතුරු සඳහා

කාර්යක්ෂමතා කඩඉම් විෂය නිර්දේශය

1. සේවා ගණය : කණිෂ්ඨ කළමණාකාර (JM 1-1)

2. සේවා ගණයට අයත් තනතුරු -

ප්‍රවාහන නිලධාරි
නිෂ්පාදක
කාර්මික නිලධාරි
වැඩපොළ අධිකාරි
පුස්තකාලයාධිපති
ජ්‍යෙෂ්ඨ තරුණ සේවා නිලධාරි
අභ්‍යන්තර විගණන නිලධාරි
ප්‍රසම්පාදන නිලධාරි
පරිපාලන නිලධාරි
මුල්‍ය නිලධාරි
පරිගණක වැඩ සටහන් සම්පාදක සහ විශ්ලේෂක
පුහුණු කළමනාකරු

3. කාර්යක්ෂමතා කඩඉම් - සියලුම කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණ ලිඛිත විභාග මගින් පවත්වනු ලැබේ.

4. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සඳහා විෂය නිර්දේශය

පහත සඳහන් විෂය කරුණු අතුරින් ඒ ඒ තනතුරු වලට අදාළ වන කොටස් ආවරණය වන පරිදි ඒ ඒ තනතුරට අදාළව විෂය නිර්දේශය සකස් කර ගත යුතුය.

4.1. පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (පත්වීම් දින සිට වසර 03 ක් ඇතුළත සමත් විය යුතුය.) II වන ශ්‍රේණියට

❖ ජාතික තරුණ සේවා සභාවේ පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන මණ්ඩලයක් මගින් නිරවද්‍යතාව පරික්ෂා කර බලනු ලැබිය යුතු වේ.

වගුව - 1

| අනුක්‍රමික අංකය | විෂය | මුළු ලකුණු | කාල සීමාව | විෂය නිර්දේශය (II වන ශ්‍රේණිය) |
|---|---|---|---|---|
| 01 | කාර්යාල ක්‍රම | 100 | පැය 01 ½ කි | පහත සඳහන් ක්ෂේත්‍ර පරීක්ෂා කෙරේ.<br>(අ) ආයතනයෙහි කාර්යාල වල භාවිතා වන කාර්යාල ක්‍රම පිළිබඳ මූලික දැනුම හා එම දැනුම භාවිතා කිරීම පිළිබඳව හැකියාව පරීක්ෂා කිරීම.<br>(ආ) රාජකාරී ලිපි ලේඛණ මැනවින් අවබෝධ කොට ගෙන පැහැදිලි හා සංක්ෂිප්ත සටහන් මගින් තම අදහස් / නිරීක්ෂණ නිශ්චිත අන්දමින් ඉදිරිපත් කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම.<br>(ඇ) දෙන ලද නියෝගයක් ප්‍රකාරව ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාව |
| 02. | ගිණුම් ක්‍රම | 100 | පැය 02 කි | (අ)ආයතනයෙහි කාර්යාල වල පවත්වා ගනු ලබන මූලික ගිණුම් පොත් හා මුල්‍ය කළමනාකරණය පිළිබඳ අයදුම්කරුගේ දැනුම හා අවබෝධය මැන බැලීම.<br>සහ<br>(ආ) එම දැනුම අරමුණු ඉටුකර ගැනීම සඳහා යොදා ගැනීමේ හැකියාව. |
| 3. | විෂයානු බද්ධ දැනුම | 100 | පැය 02 කි | (අ) තනතුරට සහ සේවා ගණයට අදාළව අයදුම්කරුගේ විෂයානු බද්ධ දැනුම තක්සේරු කිරීම.<br>(ආ) විෂයට අදාළව සිදු කළ කාර්ය පරිපාටිමය සහ නීතිමය නව්‍යකරණ පිළිබඳ දැනුම,<br>සහ<br>(ඇ) සිය අත්දැකීම් හරහා අයදුම්කරු කාර්යාල ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ළගා කර ගෙන ඇති ප්‍රවීණතා ඇගයීම. |

➢ පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් වීම සඳහා සෑම අපේක්ෂකයෙකු ම අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

4.2. දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (I වන ශ්‍රේණියට උසස් වූ දින සිට වසර පහක් (05) ඇතුලත සමත් විය යුතු ය.)

වගුව - 2

| අනුක්‍රමික අංකය | විෂය | මුළු ලකුණු | කාල සීමාව | විෂය නිර්දේශය (1වන ශ්‍රේණිය) |
|---|---|---|---|---|
| 01 | ආයතනික කාර්ය පරිපාටි | 100 | පැය 01 ½ කි | ජාතික තරුණ සේවා සභාවේ කාර්ය පරිපාටි සංග්‍රහයේ විධිවිධාන පිළිබඳ අයදුම්කරුගේ දැනුම පරීක්ෂා කෙරේ. |
| 02. | රාජ්‍ය මුල්‍ය පාලන ක්‍රමවේද | 100 | පැය 01½ කි | පහත සඳහන් ක්ෂේත්‍ර පරීක්ෂා කෙරේ<br>(අ) ආයතනයෙහි කාර්යාලවල භාවිතා වන මුල්‍ය කළමනාකරණය හා පාලනය, මුදල් භාරකත්වය, ආදායම් සහ ගෙවීම්, අයවැය ඇස්තමේන්තු, සැපයීම්, වැඩ හා සේවා පිළිබඳ දැනුම සහ අවබෝධය.<br>(ආ) සමීක්ෂණ මණ්ඩල සහ ගබඩා පවත්වාගෙන යෑම. |
| 03. | විෂයානු බද්ධ දැනුම | 100 | පැය 02 කි | පහත සඳහන් ක්ෂේත්‍ර පරීක්ෂා කෙරේ<br>(අ) අයදුම්කරුගේ ධූර කාලය තුළ ,ප්‍රථම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් ආවරණය වූ විෂයට අදාළව සිදුකළ කාර්ය පරිපාටියම සහ නීතිමය නව්‍යකරණය පිළිබඳ දැනුම,<br>(ආ) තනතුරට සහ ක්ෂේත්‍රයට අදාළව අයදුම්කරුගේ දැනුම තක්සේරු කිරීම.<br>සහ<br>(ඇ) සිය අත්දැකීම් හරහා අයදුම්කරු කාර්යාල ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ලබාකර ගෙන ඇති ප්‍රවීණතා ඇගයීම. |

- දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම සඳහා සෑම අපේක්ෂකයෙකු ම 40% ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය.

ජාතික තරුණ සේවා සභාව

"කළමනාකාර" සේවා ගණයේ තනතුරු සඳහා

කාර්යක්ෂමතා කඩඉම් විෂය නිර්දේශය

1.සේවා ගණය : කළමනාකාර (MM1-1)

2. සේවා ගණයට අයත් තනතුරු -

නිකේතනාධිපති
අභ්‍යන්තර විගණක
සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත්, පරිපාලන)
ඉංජිනේරු (සිවිල්) / සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉදිකිරීම් හා නඩත්තු)
සහකාර අධ්‍යක්ෂ (සැපයීම්)
සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)
සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ)
සහකාර අධ්‍යක්ෂ (නීති සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්)
සහකාර අධ්‍යක්ෂ (කාර්මික සහ වෘත්තීය පුහුණු)
සහකාර අධ්‍යක්ෂ (සැලසුම් හා සංවර්ධන)
සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික්)
සහකාර අධ්‍යක්ෂ
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මානව සම්පත්, පරිපාලන)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංවර්ධන)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (කාර්මික සහ වෘත්තීය පුහුණු)
නියෝජ්‍ය අධ්‍යක්ෂ
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පලාත්)
ලේකම්

3. කාර්යක්ෂමතා කඩඉම් - සියලුම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ ලිඛිත විභාගය මගින් පවත්වනු ලැබේ.

4. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා විෂය නිර්දේශය:

- ❖ පහත සඳහන් විෂය කරුණු අතුරින් ඒ ඒ තනතුරු වලට අදාළ වන කොටස් ආවරණය වන පරිදි ඒ ඒ තනතුරට අදාළව විෂය නිර්දේශය සකස් කර ගත යුතුය.

4.1. පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (පත්වීම් දින සිට වසර 03 ක් ඇතුළත සමත් විය යුතුය.) II වන ශ්‍රේණියට

- ❖ ජාතික තරුණ සේවා සභාවේ පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන මණ්ඩලයක් මගින් නිරවද්‍යතාව පරීක්ෂා කර බලනු ලැබිය යුතු වේ.

වගුව - 1

| අනුක්‍රමික අංකය | විෂය | මුළු ලකුණු | කාල සීමාව | විෂය නිර්දේශය (II වන ශ්‍රේණිය) |
|---|---|---|---|---|
| 01 | සාමාන්‍ය පරිපාලනය සහ රාජ්‍ය ප්‍රතිපත්තිය | 100 | පැය 2 ½ කි | පහත සඳහන් ක්ෂේත්‍ර පරීක්ෂා කෙරේ.<br>(අ) යහපත් කාර්යාල පරිපාටි, පරිපාලන ක්‍රමවේද, ජාතික තරුණ සේවා සභාවේ වර්තමාන චක්‍රලේඛ උපදෙස් සහ ආයතන සංග්‍රහයේ සහ විධිවිධාන සංග්‍රහය පිළිබඳ දැනුම.<br>(ආ) ජාතික තරුණ සේවා සභාවේ කාර්ය භාර්ය පිළිබඳ වර්තමාන රාජ්‍ය ප්‍රතිපත්තිය ගැන දැනුම. |
| 02 | රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | 100 | පැය 2 ½ කි | රාජ්‍ය සංස්ථා අංශය කෙරෙහි විශේෂ අවධානය ඇතිව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපතත්ති සහ පරිපාටි පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම මැන බැලීම |
| 03 | කළමනාකරණය (පොදු) | 100 | පැය 1 ½ කි. | (අ) නිර්මාණාත්මකව සිතීමේ සහ ගැටළු විසඳීමේ හැකියාව,ආයතන කළමනාකරණයට අදාලව අපේක්ෂකයාගේ දැනුම මැන බැලීම.<br>(ආ) කළමනාකරණ සිද්ධාන්ත පිළිබඳ දැනුම. |

- ➢ පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් වීම සඳහා සෑම අපේක්ෂකයෙකු ම අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

4.2. දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා විෂය,ලකුණු සහ විෂය නිර්දේශය: පළමුවන ශ්‍රේණියට උසස් වූ දින සිට වසර පහක් (05) ඇතුලත සමත් විය යුතු ය.

- ❖ මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් වීම සඳහා අදාළ ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් ලබා තිබිය යුතුය.